# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල



| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 764 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 06/05/2024<br>පැය 1030 |

# මාධ්‍ය නිවේදනය

## “සුවසාර කැදැල්ල”මධ්‍යස්ථාන පිහිටුවීම.

පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සංකල්පයක් ලෙස මත්ද්‍රව්‍ය ව්‍යසනය ශ්‍රී ලාංකීය ජනසමාජය තුලින් මුලිනුපුටා දැමීම අරමුණු කර ගනිමින් දිවයිනේ පිහිටි පොලිස් ස්ථාන 602 ක් ආවරණය කරමින් ආරම්භ කරනු ලැබූ යුක්තිය මෙහෙයුමට සමගාමීව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් මුදවාලමින් ඔවුන් සඳහා සුරක්ෂිත අනාගතයක් නිර්මාණය කිරීම උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහභාගීත්වයෙන් සහ මාර්ගෝපදේශකත්වයෙන් මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රජා පාදක පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන 256 ක් පිහිටුවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර අවසන් කර ඇත.

“සුවසාර කැදැල්ල”නමින් ආරම්භ කර පවත්වාගෙන යාමට නියමිත පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට අදාලව නියමු ව්‍යාපෘතිය කොළඹ දිසාව කේන්ද්‍ර කොට ගනිමින් මධ්‍යස්ථාන 11 ක 2024 මැයි මස 02 සතියේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

ඒ අනුව, එක් පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් තුලින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් 50 දෙනෙකු අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහභාගීත්වයෙන් සහ මාර්ගෝපදේශකත්වයෙන් දින 14 ක පුනරුත්ථාපන කටයුතු සඳහා යෙදවීමට සැලසුම් කර ඇත.

“සුවසාර කැදැල්ල” පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා ශාසනාරක්ෂක මණ්ඩලවල ගරුතර ස්වාමීන් වහන්සේලාගේ අනුශාසකත්වයෙන් හා සහයෝගයෙන් මෙන්ම ස්වේච්ඡාවෙන් කටයුතු කිරීමට කැමති විශ්‍රාමික රාජ්‍ය වෘත්තිකයින්, ස්වේච්ඡා සේවකයින් ඇතුළු විවිධ සම්පත් දායකයින්ගේ දායකත්වයෙන් මෙම මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**